(e) මෙම පරීක්ෂණයේදී ඊයම් බෝල කෙලින්ම ජල තාපකයක රත් කිරීම සුදුසු නොවේ. හේතුව දක්වන්න.

....................................................................................................................................

....................................................................................................................................

3. විද්‍යාගාරයේදී අවතල කාචයක් භාවිතයෙන් කාච සූත්‍රයෙහි නිරවද්‍යතාව පරීක්ෂා කිරීමට ශිෂ්‍යයෙකුට පවරා ඇත. මේ සඳහා ඔහුට අවතල කාචයක් , තල දර්පණයක් , ඇල්පෙනිත්ති දෙකක් , සුදු තිරයක් (X) ආධාරක සහ ප්‍රකාශ ඒලකය සපයා ඇත.

(a) ප්‍රකාශ ඒලකය මත කාච ආධාරකයක නංවා ඇති අවතල කාචය සහ වස්තු ඇල්පෙනිත්ත ( A යයි ගනිමු) පහත රූපයේ දැක්වේ. F කාචයේ නාභිය ලක්ෂයයි.




(i) E සිට බලන විට A වස්තුව මත පිහිටි P ලක්ෂ්‍යයේ ප්‍රතිබිම්භයේ පිහිටීම විදහා දැක්වීම P සිට එන කිරණ දෙකක ගමන් මාර්ගය ඇඳ දක්වන්න. ඒ අනුව A හි ප්‍රතිබිම්භය (I) ද ඇඳ දක්වන්න.

(ii) ඉහත රූපයේ අදාළ වස්තු දුර U ලෙසත් ප්‍රතිබිම්භ දුර V ලෙසත් ලකුණු කරන්න.

(iii) X තිරය තැබීමට වඩාත් සුදුසු ස්ථානයේ තිරය ඉහත රූපයේ ඇඳ දක්වන්න. තිරය තිබීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

....................................................................................................................................

(b) ප්‍රතිබිම්බයේ පිහිටීම නිශ්චය කර ගැනීම සඳහා යොදාගන්නා

(i) තල දර්පනය ( M ) තැබිය යුතු ස්ථානය පහත සඳහන් ඒවායින් කවර ස්ථානයකද ?

- L කාචය සහ ඇස අතර
- L කාචය F අතර

(ii) අනෙක් ඇල්පෙනිත්ත (B) තැබිය යුතු ස්ථානය පහත සඳහන් ඒවායින් කවර ස්ථානයකද ?

- M සහ E අතර
- L සහ M අතර
- L සහ A අතර

(c) (i) ප්‍රතිබිම්බ දුර V නිර්ණය කර ගැනීම සඳහා යොදා ගන්නා සමපාත ක්‍රමයේ අත්‍යාවශ්‍ය පියවර ලියා දක්වන්න

..............................................................................................................................

..............................................................................................................................

(ii) V දුර නිර්ණය කිරීමට පාඨාංක ලබා ගන්නා අවස්ථාවේදී M සහ B හි පිහිටීම නිවැරදි ආකාරයෙන් පහත රූපයේ ඇඳ දක්වන්න. සමපාත වන ප්‍රතිබිම්බවල පිහිටීමද ඇඳ දක්වන්න. .

..............................................................................................................................

..............................................................................................................................




(iii) ඉහත c (ii) හි සඳහන් අවස්ථාවේදී V දුර නිර්ණය කිරීමට ලබා ගන්නා පාඨාංක දෙක x සහ y ලෙස රූපයේ දක්වා V සඳහා ප්‍රකාශනයක් x සහ y ඇසුරෙන් ලියන්න.

V = ..............................................................................................................

(d) (i) U සහ V නිර්ණය කළ පසු සූත්‍රය නිවරදි බව සනාථ කිරීමට අඳින ප්‍රස්ථාරයේ අක්ෂය පහත අක්ෂ පද්ධතියේ ලකුණු කර බලාපොරොත්තු වන ප්‍රස්ථාරය ඇඳ දක්වන්න.




(ii) ප්‍රස්ථාරය භාවිතයෙන් කාචයේ නාභිය දුර නිර්ණය කරන්නේ කෙසේද ?

..............................................................................................................................

(c) අවතල කාචයේ නාභිය දුරට වඩා වැඩි නාභිය දුරක් ඇති උත්තල කාචයක නාභිය දුර සෙවීමට මෙම ක්‍රමය උපයෝගී කර ගැනීමට ශිෂ්‍යයා අදහස් කරයි. මේ සඳහා අවතල කාචය සහ උත්තල කාචය ස්පර්ශ කර ඉහත ( c) හි සඳහන් පරිදි පරීක්ෂණය සිදු කරන ලදී.

(i) සංයුක්ත කාචයේ නාභිය දුර නිර්ණය කිරීමට අදින ප්‍රස්තාරය ඉහත d(1) හි සඳහන් අක්ෂ පද්ධතිය ඇති කඩදාසියේ අදින්න.( අක්ෂ වල පරිමාණ d(i) හි අගයන් ලෙසම ගන්න) එම ප්‍රස්තාරය 2 ලෙස නිවැරදිව නම් කරන්න.

(ii) උත්තල කාචයේ නාභිය දුර නිර්ණය කිරීමට අවශ්‍ය සමීකරණය ලියා දක්වන්න.

.................................................................................................................................

4.

(a) මීටර් සේතුවක් භාවිතයෙන් නොදන්නා P ප්‍රතිරෝධයක අගය සෙවීම සඳහා ඔබට පහත අයිතම සපයා ඇත.

- මීටර් සේතුව
- P ප්‍රතිරෝධකය
- 2V කෝෂයක්
- මධ්‍ය ශුන්‍ය ගැල්වනෝමීටරයක්
- විචල්‍ය ප්‍රතිරෝධකයක් (R)
- සර්පන යතුර (S)
- ජේනු යතුරු දෙකක් ( $K_1$ හා $K_2$ )
- 1 kΩ ප්‍රතිරෝධකයක්
- සම්බන්ධක කම්බි

(i) P හි අගය නිර්ණය කිරීමට යොදාගන්නා පරිපථය පහත මීටර් සේතුවට අයිතම සම්බන්ධ කිරීම මගින් පෙන්වන්න. අයිතම සඳහා සම්මත සංකේත යොදා ගන්න.




(ii) R සඳහා ඔබ යොදා ගන්නේ ධාරා නියාමයක්ද? නැතහොත් ප්‍රතිරෝධ පෙට්ටියක්ද ඔබගේ පිළිතුරට හේතු දෙන්න.

.................................................................................................................................

.................................................................................................................................

(iii) ශිෂ්‍යයා සංතුලන ලක්ෂ්‍යය කම්බියේ මැද පෙදෙසෙහි ලැබෙන සේ R සීරුමාරු කරනු ලැබේ. මෙමගින් පරීක්ෂණයට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

1.........................................................................................................................

2.........................................................................................................................

(iv) 1 kΩ ප්‍රතිරෝධකයෙහි ප්‍රයෝජනය කුමක්ද ?

.................................................................................................................................

.................................................................................................................................

(v) සංතුලන ලක්ෂ්‍යයට A කම්බියේ වම් කෙලවරේ සිට මැනූ දුර $l$ m විය. P,R සහ $l$ සම්බන්ධ කරන සමීකරණය ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

(b) වෙනත් ශිෂ්‍යයෙකු විශ්කම්භය d වූ YZ ලෝහ කම්බියක ප්‍රතිරෝධකතාව $\rho$ සෙවීමට P ප්‍රතිරෝධය වෙනුවට සේතුවේ වම් හිදැසට YZ කම්බියේ Y කෙළවර සහ X සර්පන යතුර සම්බන්ධ කරන ලදී. දකුණු හිදැසට ඔබ a (ii) හි සඳහන් කළ උපකරණය සම්බන්ධ කර YX දුර x වෙනස් කරමින් සංතුලන ලක්ෂ්‍යයට A කෙළවරේ සිට දුර L මනින ලදී.




ශිෂ්‍යයා පළමුව x = 0.2 m ලෙස තබා L හි අගය 0.3 m ට වැඩි වන සේ R සකසන ලදී. එවිට R= 1 Ω විය. x = 0.2 m, 0.4 m,0.6 m, 0.8 m සහ 1.0 m සඳහා ශිෂ්‍යයා මිනුම් ලබා ගන්නා ලදී.

(i) x ,L,R, $\rho$ , සහ d සම්බන්ධ කරන ප්‍රකාශණය ලියන්න.

.......................................................................................................................

(ii) ප්‍රස්ථාරයක් ඇඳීම සඳහා 1/x අගය X අක්ෂයේ සිටින සේ ඉහත සමීකරණය y = mx +c ආකාරයට සකසන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(iii) ඉහත b(ii) හි සඳහන් පරිදි ප්‍රස්තාරය ශිෂ්‍යයා විසින් අඳින ලදී. එහි අනුක්‍රමණය S.I. ඒකක වලින් 2.3 ක් විය. අනුක්‍රමණයේ S.I. ඒකක සඳහන් කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

(iv) කම්බියේ විෂ්කම්භය d ලබා ගැනීමට භාවිතා කරන උපකරණය සඳහන් කර d ට වඩා හොඳ අගයක් ලබා ගැනීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ගය සඳහන් කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(v) d හි මධ්‍යන්‍ය අගය 0.4 mm විය. ඉහත b(iii) හි අනුක්‍රමණය ප්‍රයෝජනයට ගෙන ප්‍රතිරෝධකතාව $\rho$ ගණනය කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස(උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2021

| භෞතික විද්‍යාව II | 01 S II | 13 ශ්‍රේණිය |
|---|---|---|

## B කොටස

ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

5. (a) හමුදා කඳවුරක අවි ගබඩාවක් තනා ඇත්තේ බාහිර බිත්තිය 25 cm ක ඝනකම ගඩොල් බිත්තියකින් සහ එහි අභ්‍යන්තරය 3 cm ඝනකම ලෝහ තහඩුවකින් ගබඩාව ආවරණය වන සේය. සිරස් බිත්තියට ලම්බකව $400\ ms^{-1}$ ක තිරස් ප්‍රවේගයෙන් ස්කන්ධය 200 g ක් වන උණ්ඩයක් බාහිර බිත්තියේ වදියි. (1 රූපය බලන්න) ගඩොල් බිත්තියෙන් සහ ලෝහ තහඩුවෙන් උණ්ඩයේ චලිතයට ඇතිකරන ප්‍රතිරෝධ බල පිළිවෙලින් $8 \times 10^3$ N සහ $5 \times 10^5$ Nවේ.



( 1 රූපය )

(I) මෙම උණ්ඩය ගඩොල් බිත්තිය - ලෝහ තහඩුව සීමාවට පැමිණෙන සිට එහි ප්‍රවේගය සොයන්න.

(ii) අවි ගබඩාව ඉහත උණ්ඩයෙන් ආරක්ෂා වන බව පෙන්වන්න.

(i) ගඩොල් බිත්තියට ඇතුල් වන මොහොතේ සිට කාලය t ද සමඟ උණ්ඩයේ ප්‍රවේගය වෙනස් වීම ප්‍රස්ථාරගත කරන්න.

(b) ඉහත (a) හි සඳහන් උණ්ඩය විදින ලද්දේ අවි ගබඩාවට ඉදිරියෙන් ඇති වැවක පාවෙන ප්‍රහාරක බෝට්ටුවක සිටි ප්‍රහාරක භටයන් විසින්ය. ( 2 රූපය බලන්න ) ගබඩාවේ සිට ප්‍රහාරක ස්ථානයට තිරස් දුර 100 m ක් විය.



(2) රූපය

දෙවන පිටුව බලන්න

(i) තුවක්කු කඳේ තිරසට ආනතිය $\theta$ හි අගය සොයන්න.

(ii) බෝට්ටුව ,උණ්ඩය රහිත තුවක්කුව සහ සතුරු ප්‍රහාරක බටයන්ගේ මුළු සක්න්ධය 480 kg ක් විය. බෝට්ටුවේ ජලය තුල ගිලී ඇති පරිමාව සොයන්න. ජලයේ ඝනත්වය 1000 $kgm^{-3}$ වේ.

(iii) තුවක්කුව බෝට්ටුවට සවිකර ඇත්නම් උණ්ඩය පිට කරන විට බෝට්ටුව චාංගු වන තිරස් ප්‍රවේගය සොයන්න.

(iv) ඉහත b(iii) හි වූ ප්‍රවේගය නිසා බෝට්ටුව චාංගු වන තිරස් දුර ගණනය කරන්න. බෝට්ටුවේ චලිතයට ජලය මගින් ඇතිකරන නියත ප්‍රතිරෝධ බලය 50 N කි.

(v) බෝට්ටුවේ ස්කන්ධය වැඩිකළහොත් බෝට්ටුව චාංගු වන දුර අඩු කළ හැක.බෝට්ටුවට එකතු කළ හැකි අමතර ස්කන්ධයේ උපරිම අගය සොයන්න. බෝට්ටුවේ පරිමාව 2.5 $m^3$ වේ.

6. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

සංගීත භාණ්ඩ මගින් ස්වර උත්පාදනය භෞතික විද්‍යාත්මකව පහදා දිය හැක. තත් සංගීත භාණ්ඩ වශයෙන් හඳුන්වන වයලීනය වැනි උපකරණ කම්පනය කළ හැකි ඇදි තුන්තුවලින් සමන්විත වේ. දෙකෙළවර විවෘත හෝ එක් කෙළවරක් සංවෘත නල තුල ඇති වායු කඳ කම්පනය වීමෙන් ස්වර උත්පාදනය කිරීම සුශිර භාණ්ඩ වල සිදුවේ.මෙම භාණ්ඩ දෙවර්ගයේම ස්ථාවර තරංග ඇති වේ. තාලම් පට ඝණ සංගීත භාණ්ඩයකට උදාහරණයකි. බෙරය ,තබ්ලාව ආදිය අවනන්ද භාණ්ඩ වලට උදාහරණ වේ.

සංගීත සංධ්වනි සඳහා භාවිතා වන ග්‍රෑන්ඩ් පියානෝව ඇදි කම්බි වල කම්පනය පදනම් කරගෙන සාදා ඇති සංගීත භාණ්ඩයකි. මෙහි යතුරු පුවරුවේ යතුරු 88 ක් ඇත. එහි අභ්‍යන්තරයේ වම් අත පැත්තේ දිගු ඝනකම වැඩි කම්බි ඇති අතර දකුණු අත පැත්තට යත්ම කම්බි වල දිග සහ විශ්කම්භය අඩුවේ. කම්බි සියල්ලම ලී රාමුවකට සම්බන්ධ කර ඇති අතර සෑම යතුරකටම සම්බන්ධ ලී මිටකින් කම්බියට පහරක් දීමෙන් කම්බි තිර්යක් ලෙස කම්පනය කරවනු ලැබේ. එක් මිටියක් මගින් එකවර කම්බි දෙකක් හෝ තුනක් කම්පනය වන අවස්ථාද ඇත. තන්තු වල ඝනකම අනුව උපදින තරංගයේ විස්තාරය වෙනස් වන බැවින් සමාන විපුලතාවයකින් යුත් ස්වර නිපදවීට මෙම යාන්ත්‍රණය යොදා ඇත. ඉහළ විස්තාර සහිත නිපදවන තරංග පරිමණ්දනය කිරීමේ යාන්ත්‍රණයක්ද පවතී. පියානෝවේ පහළින් පාදයෙන් ක්‍රියාත්මක කළ හැකි පැඩල තුනක් ඇත. මේවා මගින් කම්බි එකක් කම්පනය කරන්නේද දෙකක් හෝ තුනක් කම්පනය කරන්නේද යන්න තෝරා ගත හැක.

(a) පහත සඳහන් අවස්ථාවල ඇති වන්නේ තිර්යක් තරංගයක්ද ? නැතහොත් අන්වායම තරංගයක්ද ? යන්න සඳහන් කරන්න.

1) ග්‍රෑන්ඩ් පියානෝවේ කම්බි කම්පනයේදී

2) බට නලාවේ වායු කඳ කම්පනයේදී

(b) තරංග වල පොදු ගුණ හතර දක්වා සංගීත භාණ්ඩ වල ස්ථාවර තරංග සෑදීමට දායක වන ගුණ දෙක සඳහන් කරන්න.

(c) සංගීත භාණ්ඩ වර්ග හතර දක්වා ඒවාට උදාහරණයක් බැගින් දෙන්න.

(d) බොහෝ වෙලාවක් ශබ්දය පවතින ස්වරයක් නිපදවීමට ග්‍රෑන්ඩ් පියානෝවේ යොදා ඇති යාන්ත්‍රණය කුමක්ද?

(e) සංඛ්‍යාත අඩු ස්වර නිපදවන්නේ ග්‍රෑන්ඩ් පියානෝවේ වම් අත පැත්තේ යතුරු මගින්ද ? නැත්නම් දකුණු අත පැත්තේ යතුරු මගින්ද ? පිළිතුර පහදන්න.

(f) ග්‍රෑන්ඩ් පියානෝවේ විවිධ ස්වර නිපදවන්නේ වෙනස් කම්බි මගිනි. කම්බි සියල්ලම ඇඩි තඹ වලින් සෑදී ඇත. මෙහි $A_0$ සහ $A_4$ ලෙස නම් කර ඇති ස්වර දෙක නිපදවෙන කම්බි වල කම්පන දිග, ආතතිය , විශ්කම්භය පහත වගුවේ දක්වා ඇත. $A_0$ සහ $A_4$ ස්වර වල සංඛ්‍යාතයන්ද දක්වා ඇත.

| ස්වරය | සංඛ්‍යාතය (Hz) | කම්බියේ කම්පන දිග (m) | තන්තුවේ ආතතිය | කම්බියේ විශ්කම්භය |
|---|---|---|---|---|
| $A_0$ | 27.5 | 2 | T | d |
| $A_4$ | 440 | $l$ | 4T | d/2 |

(i) $l$ හි අගය ගණනය කරන්න.

(ii) $A_4$ ස්වරය නාද වන විට වාතයේ උෂ්ණත්වය 27 °C ක් විය. 27 °C දී වාතයේ ධ්වනි ප්‍රවේගය 330 $ms^{-1}$ වේ. ස්වරය වාතයේ ගමන් කරන විට අනුයාත සම්පීඩන ස්ථාන දෙකක් අතර දුර සොයන්න.

(iii) වාතයේ උෂ්ණත්වය 30 °C දක්වා ඉහළ ගියහොත් 27 °C දී $A_4$ ස්වරයේ තරංග ආයාමයට වඩා තරංග ආයාමය කොපමණ ප්‍රමාණයකින් වෙනස්වේද යන්න ගණනය කරන්න.

(g) $A_4$ ස්වරය නිපදවීමට කම්බි දෙකක් භාවිතා වන අවස්ථාවක එක් කම්බියක දිග ස්වල්පයක් වෙනස්වීම නිසා 2 Hz සංඛ්‍යාතයකින් ස්පන්ද ඇසිණ. දිග අඩු කම්බියේ දිග ඉහත f(i) හි ගණනය කළ $l$ අගය ලෙස ගෙන අනෙක් කම්බියෙහි දිග වැඩිවීම ගණනය කරන්න.

(h) ග්‍රෑන්ඩ් පියානෝව කාමරයක් තුළ වාදනය වන අවස්ථාවක එක් ස්වරයක කම්බි තුනක් කම්පනය වන විට ඇතිවන තීව්‍රතා මට්ටම 110 dB විය. එක් කම්බියක් පමණක් කම්පනය කළහොත් ඇතිවන තීව්‍රතා මට්ටම ගණනය කරන්න.

7.

(a) ගෝලාකාර ද්‍රව මාවකයක් දෙපස පීඩන අන්තරය $\Delta P$ යන්න $\Delta P = \frac{2T}{r}$ මගින් දෙනු ලැබේ. මෙහි T යනු ද්‍රවයේ පෘෂ්ඨික ආතතිය වන අතර r යනු මාවකයේ වක්‍රතා අරයයි.මෙම ප්‍රකාශණය මාන අනුව නිවැරදි බව පෙන්වන්න.

(b) පහළට යන විට ක්‍රමයෙන් සිහින් වන සිරස් වීදුරු කේශික නලයක් (i) රූපයේ දැක්වේ. එහි h උස ද්‍රව කඳක් සිරවී ඇතැයි සිතන්න. ඉහළ සහ පහළ ද්‍රව මාවකයන්ගේ ස්පර්ශ කෝණ ශුන්‍ය ලෙස සලකා h සඳහා ප්‍රකාශණයක් ඉහළ ද්‍රව මාවකයේ අරය R ,පහළ ද්‍රව මාවකයේ අරය r , ද්‍රවයේ ඝනත්වය $\rho$ ද්‍රවයේ පෘෂ්ඨික ආතතිය T සහ ගුරුත්වජ ත්වරණය g ඇසුරෙන් ලබා ගන්න. එනයින් මෙලෙස ද්‍රව කඳ නලය තුල පිහිටිය නොහැකි බව පෙන්වන්න.



(1) රූපය

(c) (i) ඉහත (b) හි සඳහන් ද්‍රව කඳ නලය තුල පිහිටිය හැක්කේ (2) රූපයේ දැක්වෙන පරිදි පහළ A කෙළවර වාතයට උත්තල ද්‍රව මාවකයක් නලය තුල පිහිටීම මගිනි. ඉහළ ද්‍රව මාවකයේ වක්‍රතා අරය 1 mm වන අතර ස්පර්ශ කෝණය ශුන්‍ය වේ.

(i) h = 3 cm ද, T = 7.5 x $10^{-2}$ $Nm^{-1}$ ද, $\rho = 1000$ kg $m^{-3}$ ද නම් පහළ ද්‍රව මාවකයේ වක්‍රතා අරය ගණනය කරන්න.



(2) රූපය

(ii) මෙම නලයේ උස H ද ඉහළ B කෙළවර සහ පහළ A කෙළවර නලයේ අරයයන් පිළිවෙලින් 1.2 mm සහ 0.5 mm වේ. ඉහළ කෙළවර ද්‍රව මාවකය වාතයට අවතල වනසේ B කෙළවර අරයට සමාන වනවිට, පහළ කෙළවර ද්‍රව මාවකයේ අරය A කෙළවර අරයට සමාන වේ.

(3) රූපය බලන්න. H උස ගණනය කරන්න.



(3) රූපය

(d) අභ්‍යන්තර විෂ්කම්භය 1 mm වූ ඒකාකාර කේෂික නලයක ඉහත (c) හි සඳහන් ද්‍රවය $h_0$ උසකට ඇතිවිට පහළ කෙළවරකින් ද්‍රව බිංදුවක් වැස්සේ.

(i) ද්‍රව බිංදුව වැස්සෙන විට එහි ගෙලෙහි {(4) රූපය බලන්න} පරිධිය ගණනයකරන්න. $\pi = \frac{22}{7}$ ක්ලෙසගන්න.

(ii) ගිලිහෙන ද්‍රව බිංදුවේ අරය ගණනය කරන්න.
( $2^{-1/3} = 0.8$ ක් ලෙස ගන්න)



(4) රූපය

(e) ද්‍රව බිංදුවේ අරය වෙනස් නොවී වාතය තුල පහළට වැටෙන්නේ යයි සලකන්න. ද්‍රව බිංදුව ආන්ත ප්‍රවේගයට ලඟා වනවිට වාතයෙන් එය මත ඇති කරන දුස්ස්‍රාවිතා බලය ගණනය කරන්න. වාතයෙන් ද්‍රව බිංදුව මත ඇති කරන උත්ප්ලාවකතා බලය නොගිණිය හැකි යයි සලකන්න.

**8.** විශ්වයේ මන්දාකිණි විශාල සංඛ්‍යාවක් ඇති අතර අප ජීවත්වන සෞරග්‍රහ මණ්ඩලය අයත් වන්නේ ක්ෂිර පථ මන්දාකිණියටය. කිෂිරපථ මන්දාකිණිය මැදින් පිම්බී ඇති තැටියක ආකාරය ගනියි. මෙම තැටියේ විෂ්කම්භය ආලෝක වර්ෂ $10^5$ ක් පමණ වෙ යයි ගණන් බලා තිබෙ . මන්දාකිණියේ ඇති තාරකා ක්ෂිරපථයේ කේන්ද්‍රය වටා භ්‍රමණය වේ. මෙහි ඇති තරු වලින් 90% ක්ම පවතිනුයේ ආලෝක වර්ෂ 17500 ක අරයක් ඇති ප්‍රදේශයේය. ( මෙම ප්‍රදේශයේ ස්කන්ධය ක්ෂිර පථයේ මුළු ස්කන්ධයෙන් 90% ක් ලෙස සැලකිය හැක) මන්දාකිණියේ ඇති සමහර තරු කළු කුහර ලෙස ක්‍රියා කරයි. එම තරුවල විමෝග ප්‍රවේගය, ආලෝක ප්‍රවේගයට වඩා වැඩි නිසා තරු පිටකරන ආලෝකය පිටතට නොපැමිණේ.

(a) (i) ග්‍රහ වස්තුවක විමෝග ප්‍රවේගය හඳුන්වන්න.

(ii) ස්කන්ධය M වන අරය R වූ ඒකාකාර ගෝලාකාර ග්‍රහ වස්තුවක විමෝග ප්‍රවේගය සඳහා ප්‍රකාශණයක් M,R සහ සර්වත්‍ර ගුරුත්වාකර්ෂණ නියතය G ඇසුරෙන් ලබා ගන්න.

(b) පදාර්ථ වල මුළු ස්කන්ධය $M_0$ වන පදාර්ථ වල ස්කන්ධ කේන්ද්‍රය වටා අරය r වූ වෘත්තාකාර පථයක ගමන් කරන ස්කන්ධය m වූ පදාර්ථයක් ආවර්ත කාලය T යන්න

$$T^2 = \left[\frac{4\pi^2}{GM_0}\right] r^3$$

මගින් දෙනු ලබන බව පෙන්වන්න.

( $M_0$ ස්කන්ධය කේන්ද්‍රයේ සාන්ද්‍රනය වී ඇතැයි සළකන්න.)

(c) (i) ක්ෂිරපථයේ කේන්ද්‍රය වටා අරය ආලෝක වර්ෂ 17500 ක අරයක භ්‍රමණය වන තරුවක වේගය $2.4 \times 10^5\ m\ s^{-1}$ වේ. ක්ෂිරපථයේ මුළු ස්කන්ධය ගණනය කරන්න.

ආලෝක වර්ෂ $1 = 9.5 \times 10^{15}$ m

සර්වත්‍ර ගුරුත්වාකර්ෂණ නියතය $= 6.67 \times 10^{-11}\ N\ m^2\ kg^{-2}$

$$= \frac{20}{3} \times 10^{-11}\ N\ m^2\ kg^{-2}$$

(ii) ක්ෂිරපථයේ ඇති තරුවක මධ්‍යන්‍ය ස්කන්ධය අපගේ සූර්යයාගේ ස්කන්ධය වන $2 \times 10^{30}$ ලෙස ගෙන ක්ෂිරපථයේ ඇති තරු ගණන නිමානනය කරන්න.

(d) ක්ෂිරපථයේ කේන්ද්‍රය වටා සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයා භ්‍රමණය වීමෙදී එක් වටයක් යාමට ගතවන කාලය අවුරුදු වලින් සොයන්න.ක්ෂිරපථයේ කේන්ද්‍ර යේ සිට සූර්යයාට දුර ආසන්න වශයෙන් ආලෝක වර්ෂ $2.3 \times 10^4$ ක් වේ. $\sqrt{6} = 2.45$ ලෙසද $(21.85)^{3/2} = 102$ ලෙස ද ගන්න.

(e) ක්ෂිරපථයේ කේන්ද්‍රය ආසන්නයේ ඇති සැගටෙරියස් A ( Sagi ttarius A ) ලෙස හඳුන්වන කළු කුහරය අපගේ සූර්යයා මෙන් $3.7 \times 10^6$ ගුණකය ස්කන්ධයක් ඇත. මෙම කළු කුහරයට තිබිය හැකි උපරිම අරය සොයන්න.

(f ) විශ්වය පිළිබඳ නිරීක්ෂණ ලබා ගන්නා පෘථිවිය වටා කක්ෂගත කර ඇති හබල් දුරේක්ෂයේ කක්ෂයට පෘථිවියේ සිට උස 550 km වේ. එහි ස්කන්ධය 12000 kg වේ. මෙම දුරේක්ෂය කක්ෂගත කිරීමට වැය කර ඇති ශක්තිය ගණනය කරන්න.

9. **(A) කොටසට හෝ (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

(A) (a) ප්‍රතිරෝධය R වන ප්‍රතිරෝධකයක් පහත (1) රූපයේ දැක්වෙන පරිපථයක සම්බන්ධ කරන ලදී. මෙම පරිපථයේ ඇති V වෝල්ට්මීටරය පරිපූර්ණ එකකි. A ඇමීටරයේ ප්‍රතිරෝධය 2 Ω ක් වේ. E කෝෂයේ විද්‍යුත් ගාමක බලය 2 V වේ. S ස්විචය වැසූ විට V සහ A හි පාඨාංක පිළිවෙලින් 0.99 V සහ 0.5 V වේ.



(1) රූපය

(i)R හි අගය සහ කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය ගණනය කරන්න. වෝල්ට්මීටරය පමණක් පරිපූරණය එකක් ලෙස ගන්න.

(ii) ඉහත පරිපථයේ ඇමීටරය , පරිපූර්ණ ඇමීටරයකින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. එවිට S ස්විචය වැසූ විට වෝල්ට්මීටර සහ ඇමීටර පාඨාංක ගණනය කරන්න. R හි අගය ඉහත (a) 1 හි ගණනය කළ අගය ලෙස ගන්න.

(b) ඉහත (1) රූපයේ දැක්වෙන පරිපථයේ R ප්‍රතිරෝධකය තැනී ඇත්තේ ටංස්ටන් කම්බියකිනි. එහි විෂ්කම්භය 0.35 mm වේ. S ස්විචය වසන අවස්ථාවේ R ප්‍රතිරෝධකයේ උෂ්ණත්වය 30 °C ක් විය.

(i) 30 °C දී ටංස්ටන් වල ප්‍රතිරෝධකතාව $5.5 \times 10^{-8}$ Ωm ලෙස ගෙන කම්බියේ දිග ගණනය කරන්න.

(ii) ඉහත (a)(1) අවස්ථාවේදී R හි උත්පාදනය වන තාපයෙන් 50% ක් පරිසරයට හානි වේ. S සිවිචය වසා විනාඩි 5 කදී R ප්‍රතිරෝධකයේ උෂ්ණත්වය ගණනය කරන්න. මෙම කාලය තුල R හි මධ්‍යන්‍ය අගය 2 Ω බව උපකල්පනය කරන්න. ටංස්ටන් ලෝහයේ ඝනත්වය සහ විශිෂ්ට තාප ධාරිතාව පිළිවෙළින් 19250 kg $m^{-3}$ සහ 135 J $kg^{-1}K^{-1}$ වේ. ( පිළිතුර ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.)

(iii) ඉහත b(ii) හි ගණනය කළ උෂ්ණත්ව නැග්ම නිසා R ප්‍රතිරෝධකයේ ඇත්ත වශයෙන්ම පවතින අගය ගණනය කරන්න. ටංස්ටන් ලෝහයේ ප්‍රතිරෝධයේ උෂ්ණත්ව සංගුණකය $4.5 \times 10^{-3} K^{-1}$ ලෙස ගන්න. ( පිළිතුර පළමු දශස්ථානයට වටයන්න)

(iv) ඉහත b(iii) හි තත්වය යටතේ ඇමීටර සහ වෝල්ට්මීටර පාඨාංක ගණනය කරන්න. අනෙක් උපාංග වල ප්‍රතිරෝධය නොවෙනස් වන බව සලකන්න( පිළිතුර දශමස්ථාන දෙකකට වටයන්න)

(c) ඉහත (a) කොටසේ සඳහන් ඇමීටරයේ පූර්ණ පරිමාණ උත්ක්‍රමය 0.5 A විය. (0-1) A පරාසය මැනීමට ඇමීටරයට සුදුසු $R^1$ ප්‍රතිරෝධකයක් සම්බන්ධ කරන අන්දම සම්මත සංකේත ඇසුරෙන් පෙන්වන්න. $R^1$ හි අගයද සොයන්න.

(B) (a) (i) ඒක ධ්‍රැව ට්‍රාන්සිස්ටරයක් සහ ද්වි ධ්‍රැව ට්‍රාන්සිස්ටරයක් අතර ප්‍රධාන වෙනස කුමක්ද ?

(ii) ද්වි ධ්‍රැව සන්ධි ට්‍රාන්සිස්ටරයක සංක්‍රමණික ලාක්ෂණික වක්‍ර ඇඳ එහි ප්‍රදේශ නම් කරන්න.

(b) පහත (1) රූපයේ දැක්වෙන්නේ L විදී ලාම්පුවක් දැල්වීමට භාවිතා කරන පරිපථයකි. සූර්යාලෝකය හොඳින් ඇතිවිට එය නොදැල්වී තිබීමටත් ආලෝකය අඩු වූ විට දැල්වීමටත් පරිපථය සැලසුම් කර ඇත. මෙහි RS මගින් රිලේ ස්විචයක් දැක්වේ. එහි ඇති දඟරය තුලින් යටත් යටත් පිරිසෙයින් 50 mA ධාරාවක් ගලන විට $S_1$ ස්විචය වැසේ.මේ සඳහා X හි වෝල්ටීයතාව 5 V විය යුතුයි. කාරකාත්මක වර්ධකයේප්‍රතිදානයේ සංතෘප්ත අගය ± 5 V වේ.




1 රූපය

T ට්‍රාන්සිස්ටරයේ සරල ධාරා ලාභය $\beta = 50$ කි. RS හි සඵල ප්‍රතිරෝධය 50 Ω වේ.

(i) $S_1$ ස්විචය වැසෙන විට ට්‍රාන්සිස්ටරයේ පාදම ධාරාව කුමක්වේද ?

(ii) $S_1$ වැසෙන විට $V_{CE}$ අගය කුමක්ද ?

(iii) $R_B$ ප්‍රතිරෝධය සඳහා තිබිය යුතු අගය ගණනය කරන්න. $V_{BE} = 0.7$ V ලෙස ගන්න.

පරිපථයේ A කොටසේ ඇති ආලෝකය මත රඳා පවතින ප්‍රතිරෝධකය ( LDR) හි ප්‍රතිරෝධය $R_D$ එක්තරා දිනක වේලාව සමඟ වෙනස්වීම (2) රූපයේ දැක්වේ.

(iv) කාරකාත්මක වර්ධකයේ ඍණ ප්‍රදානයේ වෝල්ටීයතාව $V_1$ සොයන්න.

(v) $V_x = +5V$ වීමට $R_D$ ට තිබිය යුතු අවම අගය සොයන්න.

(vi) මෙහි සඳහන් දිනයේ L බල්බය දැල්වීම ආරම්භ වන වේලාව කියද ?




(2) රූපය

(C) 230V A.C.ජව මූලිකයෙන්ම 1 රූපයේ දැක්වෙන පරිපථයට අවශ්‍ය 5V වෝල්ටීයතාව ලබා ගැනීමට පහත 3 රූපයේ දැක්වෙන පරිපථය භාවිතා කළ හැක. SDT යනු අවකර පරිණාමකයකි. RB යනු පූර්ණ තරංග සෘජුකාරක සේතුව වේ.




(3 රූපය )

(i) Z සෙනර් දියෝඩයේ සෙනර් වෝල්ටීයතාව කුමක් විය යුතුද ?

(ii) අවකර පරිණාමකයේ දඟර පොටවල් 800 සහ 40 ක් නම් $H_1$ සහ $H_2$ අග්‍ර අතර ඇතිවන ප්‍රත්‍යාවර්ථ වෝල්ටීයතාවයේ rms අගය කොපමණද ?උච්ච අගය කොපමණද ?

(iii) $H_1, H_2, H_3$ සහ $H_4$ අතර ඇති පූර්ණ තරංග සෘජුකාරක සේතුව ඇඳ අග්‍ර පැහැදිලිව නම් කරන්න.

(iv) $V_c$ සහ $V_{cc}$ ට ලැබිය යුතු වෝල්ටීයතාව කාලය t සමඟ වෙනස්වීම වෙන වෙනම ප්‍රස්ථාරගත කරන්න.

(c) ඉහත (b) හි පරිපථයේ L බල්බය දැල්වෙන විට එම ආලෝකය LDR මත පතිත වුවහොත් L තව දුරටත් දැල්වේද ? පිළිතුර පහදන්න.

**10. (A) කොටසට හෝ (B) කොටසට පමණක් පිළිතුර සපයන්න.**

(A)

(a) නිවෙස් වල භාවිතයට ගන්නා ද්‍රව පෙට්‍රෝලියම් වායුව ( LPවායුව) අඩංගු සිලින්ඩරයක කාමර උෂ්ණත්වය වන 30°C දී පෙට්‍රෝලියම් වාෂ්පයේ පීඩනය $10^3$ kPa පමණ වේ. වායුවේ ද්‍රවාංකය - 42°C වේ. වායුගෝලීය පීඩනය $10^2$ kPa වේ.

(i) LP වායුවේ සංතෘප්ත වාෂ්ප පීඩනය (p) , එහි උෂ්ණත්වය ( $\theta$°C) සමඟ වෙනස් වීම දක්වන ප්‍රස්ථාරය - 42°C සිට 30°C දක්වා පමණක් අඳින්න. - 42°C උෂ්ණත්වයේදී වාෂ්පයේ පීඩනය අක්ෂය මත නිවරදිව ලකුණු කරන්න.

(ii) කෑම පිසීම සඳහා LP වායුව භාවිතා කරන විට එහි වායුවේ භාවිතය අවසාන වන තෙක්ම සිලින්ඩරය තුල පීඩනය නියතව පවතින්නේ කෙසේද ?

(b) නිවසක ලිප් දෙකකින් සමන්විත LP වායු උදුනක ( LP gas Cooker), එක් ලිපක් මත ස්කන්ධය 0.2 kg වූ ඇලුමිනියම් කේතලයක් තබා එය තුල ජලය 500 g ක් 30 °C සිට ජලයේ තාපාංකය 100 °C දක්වා රත් කිරීමට ලිප ක්‍රියාත්මක කරන ලදි. ජලය නැටීමට විනාඩි 5ක් ගත වූ බව පෙණින.

(i) උදුනේ නිපදවෙන තාපයෙන් 80% ක් පමණක් කේතලයට සහ ජලයට ලැබේ නම් මෙම කර්තව්‍යය සඳහා වැයවන LP වායු ස්කන්ධය ගණනය කරන්න.( පිළිතුර ආසන්න පූර්ණ සංඛ්‍යාවට දෙන්න.)

ඇලුමිනියම් වල විශිෂ්ට තාප ධාරිතාව = 900 J kg$^{-1}$ K$^{-1}$

ජලයේ විශිෂ්ට තාප ධාරිතාව = 4200 J kg$^{-1}$ K$^{-1}$

වායුවේ තාප ජනන අගය = 5x10$^7$ J kg$^{-1}$

(ii) නිවසක ලිප් දෙකම b(i) හි සඳහන් ආකාරයට කෑම පිසීම සඳහා භාවිතා කරන විට දිනකට විනාඩි 120 ක් කෑම පිසනු ලැබේ. මෙම නිවසේ සිලින්ඩරයේ LP වායුව භාවිතා කළ හැකි දින ගණන සොයන්න.සිලින්ඩරය තුල ද්‍රව පෙට්‍රෝලියම් තත්වය අවසන් වනතෙක් එහි ඇති ද්‍රව පෙට්‍රෝලියම් 12.5 kg ක් අඩංගු බව සලකන්න.

(c) (i) නිව්ටන්ගේ සිසිලන නියමය අනුව පරිසර උෂ්ණත්වය $\theta_R$ °C වන අවස්ථාවක සංවහන ධාරා යටතේ සිසිලනය වන වස්තුවක උෂ්ණත්වය $\theta$ °C($\theta > \theta_R$ වන තාපය හානිවීමේ ශීඝ්‍රතාව $\frac{dQ}{dt}$ යන්න පහත සමීකරණයෙන් දෙනු ලැබේ.

$$\frac{dQ}{dt} = k\,(\theta - \theta_R)$$

k නියතය රඳා පවතින සාධක දෙක සඳහන් කරන්න. උෂ්ණත්වය $\theta_i$ සිට $\theta_f$ දක්වා සිසිලනය වන විට මධ්‍යයනය තාප හානි වීමේ ශීඝ්‍රතාවය සඳහා ප්‍රකාශණයක් ලියන්න.

(ii) ඉහත (b) සඳහන් පරිදි උණු කළ ජලය 500 g බඳුනකට වත් කර එයට තේ කොළ සහ සිනි දමා එම තේ ද්‍රාවණය ඇලුමිනියම් බඳුනකට වත් කරන ලදි. එක්තරා අවස්ථාවකදී තේ ද්‍රාවණයේ උෂ්ණත්වය 80°C ක් බව සොයා ගන්නා ලදි. තේ ද්‍රාවණය කළතමින් ඇති විට එහි උෂ්ණත්වය 75 °C පැමිණීමට 100 s ක කාලයක් ගත් බව පෙණින.

(1) ඉහත c(i) හි සඳහන් ප්‍රකාශණය උපයෝගී කරගෙන තේ ද්‍රාවණයට 75 °C සිට 60 °C දක්වා සිසිල්වීමට ගතවන කාලයට අගයක් නිමානනය කරන්න. තේ ද්‍රාවණය කළතමින් ඇති බවද අවට පරිසර උෂ්ණත්වය 30 °C නොවෙනස්ව පවතින බවද සළකන්න.

(2) තේ ද්‍රාවණයට 80 °C සිට 60 °C දක්වා පැමිණීමට ගතවන මුළු කාලය සොයන්න.

(3) තේ ද්‍රාවණය සිසිල්වීම සඳහා උෂ්ණත්වය කාල වක්‍රය ( සිසිලන වක්‍රය) අඳින්න.

(d) ඉහත c(ii) හි අඳින ලද ප්‍රස්ථාරයට අනුව ආරම්භක උෂ්ණත්වය $\theta_i$ සිට $\theta_f$ උෂ්ණත්වයකට පත්වීමට ගතවන කාලය t පහත සමීකරණයෙන් නිවැරදිව දෙනු ලැබේ.

$$T = k_0 \log_{10}\left(\frac{\theta_i - \theta_R}{\theta_f - \theta_R}\right)$$ $k_0$ යනු නියතයකි.

$\theta_R$ යනු පරිසර උෂ්ණත්වයයි. මෙම සමීකරණයට අනුව ඉහත c(ii) හි සඳහන් තේ ද්‍රාවණයේ උෂ්ණත්වය 80 °C සිට 60 °C ට අඩුවීමට ගතවන කාලය සොයන්න. මෙම කාලයට සාපේක්ෂව c(ii) හි ගණනය කල කාලය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වේද ?

(B) (a) ලුවිස් ඩි බ්‍රෝග්ලි 1924 දී ඉදිරිපත් කළ තරංග අංශු ද්වෛතය සංකල්පය මගින් පදාර්ථ අංශු තරංග ගතිගුණ පෙන්වන විට එහි තරංග ආයාමය $\lambda = \frac{h}{mv}$ මගින් දෙනු ලබන බව ප්‍රකාශ කළේය. මෙහි v යනු පදාර්ථ අංශුවේ ප්‍රවේගය වන අතර m යනු එහි ස්කන්ධයයි. h යනු ප්ලාන්ක් නියතයයි. h හි මාන සොයන්න.

(b) අන්වීක්ෂයකින් පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි කුඩාම වස්තුවේ ප්‍රමාණය පතිත තරංගයේ තරංග ආයාමයෙන් අඩකට සමාන වේ. මෙම අගය අන්වීක්ෂයේ විභේදක බලය ලෙස හඳුන්වනු ලැබේ.

(i) දෘශ්‍ය ආලෝකයේ තරංග ආයාම පරාසය 400 nm සිට 780 nm දක්වා වේ. ප්‍රකාශ අන්වීක්ෂයකින් ලබා ගත හැකි හොඳම විභේදක බලය සොයන්න.

(ii) දැනට නිපදවා ඇති හොඳම විභේදක බලය සහිත ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයක විභේදක බලය 0.01nm වේ.මෙවැනි අන්වීක්ෂයක ඉලෙක්ට්‍රෝන කදම්භයක සතුවිය යුතු ඩිබ්‍රෝග්ලි තරංග ආයාමය කුමක්ද ?

(iii) ඉහත b(ii) හි සඳහන් කළ තරංග ආයාමය ලබා ගැනීමට ඉලෙක්ට්‍රෝන ත්වරණය කළ යුතු විභව අන්තරය ගණනය කරන්න.

ඉලෙක්ට්‍රෝනයක ස්කන්ධය = $9 \times 10^{-31}$ kg
ඉලෙක්ට්‍රෝන ආරෝපණය = $1.6 \times 10^{-19}$ C
ප්ලාන්ක් නියතය = $6.4 \times 10^{-34}$ Js

(iv) ප්‍රකාශ අන්වීනක්ෂයක ඇති කාච වෙනුවට ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයක යොදා ඇත්තේ කුමක්ද ?

(v) ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයක ඉලෙක්ට්‍රෝන ගමන් කරනුයේ $10^{-5}$ Hgmm තරම් අඩු පීඩනයක පවතින රික්තකයක් තුලය. මෙසේ සකසා ඇත්තේ මන්දැයි කෙටියෙන් සඳහන් කරන්න.

(c) ඉහත (a) හි සඳහන් ඩිබෝග්ලි තරංග ආයාමය සඳහා වූ සම්බන්ධය පරීක්ෂණාත්මකව තහවුරු කිරීම සඳහා ඉලෙක්ට්‍රෝන කදම්භයක් නිකල් ස්ඵටිකයක් තුලින් යැවීමෙන් ලැබුණු විවර්තන රටාව උපයෝගි විය. මෙම විවර්තන රටාව X- කිරණ කදම්භයක් ඇලුමිනියම් තහඩුවක් හරහා ගමන් කිරීමෙන් ලැබෙන විවර්තන රටාවට සමාන බව පෙණින. X- කිරණ නලයක රූප සටහනක් පහත රූපයේ දැක්වේ.




(i) F සහ T නම් කරන්න.

(ii) $10^5$V වෝල්ටීයතා සැපයුමේ P අග්‍රයේ ධ්‍රැවීයතාව කුමක්ද ?

(iii) ඊයම් ආවරණයේ ප්‍රයෝජනය කුමක්ද ?

(iv) රූපයේ දැක්වෙන X- කිරණ නලයෙන් නිපදවෙන උපරිම ශක්තියක් සහිත X- කිරණ ෆෝටෝනයක ශක්තිය කුමක්ද ? එම තරංගයේ තරංග ආයාමය nm වලින් සොයන්න. ආලෝක ප්‍රවේගය $c = 3 \times 10^8$ m s$^{-1}$ ලෙස ගන්න.

(v) පිටවන X- කිරණ වල තීව්‍රතාව $10^4$ Wm$^{-2}$ ද T හි වර්ගඵලය 4 cm$^2$ ද වේ. T මත පතිත ඉලෙක්ට්‍රෝන වල චාලක ශක්තියෙන් 99% ක් තාපය බවට පත් වේ. මෙම ඉපදවෙන තාපය මුළුමනින්ම ඉවත් කිරීම සඳහා තඹ දණ්ඩ තුලින් 50 g s$^{-1}$ ශීඝ්‍රතාවයකින් ජලය සංසරණය කරනු ලැබේ. ජලයේ උෂ්ණත්ව නැග්ම ගණනය කරන්න. ජලයේ විශිෂ්ට තාප ධාරිතාව 4200 J kg$^{-1}$ k$^{-1}$ලෙස ගන්න.



*****